# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2172/7 - 2020 අප්‍රේල් මස 22 වැනි බදාදා - 2020.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2020

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල්, අර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,
ලේකම්,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 අප්‍රේල් මස 23 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතුවන හා ගෙවිය යුතුවන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.


1A - PG 4972 — 567 (2020/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **27.10** | | | **අශුද්ධ තත්ත්වයේ හැර, පැට්‍රොලියම් තෙල් වර්ග සහ ගල්කීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාගත් තෙල් වර්ග ; බරෙන් 70% කට නොඅඩුව පැට්‍රොලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග ; වේස්ට් ඔයිල්** | | | |
| | | | | | | |
| | | - | **තෙල් වර්ග, බරෙන් 70% කට නොඅඩුව පැට්‍රොලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග (භාවිතයෙන් පසු ඉවතලන ලද තෙල් (වේස්ට් ඔයිල්) හැර ජෛව ඩීසල් අඩංගු) :** | | | |
| | | ---- | පැට්‍රෝල් | | | |
| | 2710.12.21 | ---- | ඔක්ටේන් අංක 92 සහිත පැට්‍රෝල් | | ලීටරයකට රු. 50 | කි. ග්‍රෑ. |
| | 2710.12.22 | ---- | ඔක්ටේන් අංක 95 සහිත පැට්‍රෝල් | | ලීටරයට රු. 50 | කි. ග්‍රෑ. |
| | 2710.12.29 | ---- | අනෙකුත් | | ලීටරයට රු. 50 | කි. ග්‍රෑ. |
| | | --- | ගෑස් ඔයිල්/ඩීසල් | | | |
| | 2710.19.41 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් | | ලීටරයට රු. 25 | කි. ග්‍රෑ. |
| | 2710.19.42 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට වැඩි නමුත් කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 500ට නොවැඩි ගෙන්දගම් අඩංගු අනෙකුත් ඩීසල් වර්ග | | ලීටරයට රු. 25 | කි. ග්‍රෑ. |
| | 2710.19.49 | ---- | අනෙකුත් | | ලීටයරට රු. 25 | කි. ග්‍රෑම් |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.